සාධු දැක්ම

The Excellent View

4

ජින පඤ්ජරය - The Buddha Mansion

කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක

ජින පඤ්ජරය

THE BUDDHA MANSION

IN

PALI

SINHALA

&

ENGLISH

MRS : K SEETHA N. GOONETILLEKE
DIRECTOR
Parents Memorial Scholarship Foundation
392/2, Perera Mawatha
Tel: 0112877950

BY

Kiriwattuduwage Seetha Nandanie Goonetilleke
(Director of Parents Memorial Scholarship Foundation)
011 2 877950

ප්‍රථම මුද්‍රණය - 2018

සාධු දැක්ම-The Excellent View ④

(ජිනපඤ්ජරය :The Buddha mansion ඇසුරෙනි.)

කර්තෘගේ වෙනත් පොත්

1 මා පිය ගුණ සමර

2 සාධු දැක්ම-The Excellent View ①

3 දරිද්‍රතාව හඹා යයි

4 සුවදායක මාවතක් - A Blissful Path

5 ප්‍රීතිමත් ජීවිතයකට මග

6 තුදුස් වසරක සඟන් එළියක්- A Moon Light of 14 years

7 සාධු දැක්ම-TheExcellent View ② කරණීය මෙත්ත සූත්‍රය

8 සාධු දැක්ම-TheExcellent View ③ රතන සූත්‍රය ඇසුරෙනි.

පිදුම

ජීවිතයේ යථාර්ථය මානව පසක් කරමින්
මුළු මහත් සමාජයට මාහැඟි ආදර්ශයක් ලබාදෙමින්
ගෘහස්ථ ජීවිතයේ සියලු යුතුකම්
මනාලෙස සපුරා..

රාජ්‍ය නිලධාරියෙකු, සෙන්පතියෙකු ලෙස මව්බිමට
අනුපම සේවයක් මැනවින් ඉටුකර තබා
රටට ජාතියට ණය නැති ධර්මිෂ්ඨ
මිනිස් රත්නයක් ලෙසින් ..

ජීවිතය කාලය මනා ලෙස කළමනාකරණය කරගනිමින්
යාථූතු මඟ නිසි ලෙස හඳුනාගෙන,
එඩිතරව එම බුදු මඟ ඔස්සේ
දැවැන්ත ශාසනික මෙහෙවරකට අවතීර්ණ වූ ...

මානව දයාවෙන් පිරිපුන්
කල්‍යාණ මිත්‍ර සංඝ පීතෘවර

පූජ්‍යපාද බුද්ධංගල ආනන්ද හිමිපාණන් ගේ
පින්බර දෝතට

ශ්‍රී සද්ධර්මය ම පදනම් කොටගෙන මවිසින් සම්පාදිත
මෙම 9 වන සදහම් ග්‍රන්ථයේ

කුලුඳුල් පිටපත

බුද්ධාලම්භන ප්‍රීතියෙන් සහ ගෞරව අභිමානයෙන් යුතුව
නිහතමානීව

බැතිබර සෙනෙහසින් පිදේ.

පුණ්‍යානුමෝදනාව

යහගුණ සහ කුසලතාවන් වඩාත් ඔප් නංවමින්,
සමාජයට මාහැඟි සේවයක් ඉටු කිරීම සඳහා
උතුම් මහකට මා යොමු කරවූ
අති උතුම් සංඝ පීතෘන් වහන්සේලාටත් ..

මා මෙලොවට බිහිකර අසීමිත සෙනෙහසකින් යුතුව,
බොදු හැඟුම් මාගේ හද තුළ ජනිත කරවමින්
මා හදා වඩා
ගුණ නැණ බලයෙන් මා පෝෂණය කළා වූ,

**ලෝරා හෙට්ටිආරච්චි, දයාබර මෑණියන් වහන්සේට සහ
විජයසේන කිරිවත්තුඩුව,ගුණ බර පියාණන් වහන්සේටත් ...**

දහස් සංඛ්‍යාත දරු දැරියන්ගේ නැණ පහන් දැල්වීමට හැකි
වෘත්තිමය ස්ථාවරයකට මඟ හෙළිකර දුන්
මාගේ ආදරණීය ගුරු දෙමාපියන්ටත්...

සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස ඉතාමත් දූරදර්ශීව,
අභීතව තීරණ ගනිමින්,

තිස් වසරක් පුරා පැවති සාපරාධී ත්‍රස්තවාදී උවදුරෙන්
මෙම ධර්මද්වීපය බේරාගත් ජන නායක

අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාටත් ..
සත්පුරුෂ ඥාති හිතෛෂී සැමටත් ..

**මෙම සදහම් ග්‍රන්ථ සම්පාදනයෙන් ලැබෙන්නා වූ සියලුම
පින් අනුමෝදන් කරමි. අනුමෝදන් වෙත්වා !**

සාධු ! සාධු !! සාධු !!!

පිවිසුම
Initiation

පිරුවානා පොත් වහන්සේගේ උප ග්‍රන්ථයේ සඳහන් පරිදි ජිනපඤ්ජරය පිරිතකි. පිරිත් සජ්ඣායනා කිරීමෙන් හෝ ශ්‍රවණය කිරීමෙන් හෝ ලැබෙන්නා වූ ගුණය, යමෙකු තුළ ඒ පිළිබඳව පවත්නා වූ විශ්වාසයට සාපේක්ෂ වන්නේමය. පිරිත් සජ්ඣායනාවෙන්, දුක් විඳින මිනිස් ප්‍රජාවට ගුණ ලැබුණු අවස්ථා බොහෝ ඇති බවට බෞද්ධ ඉතිහාසය සාක්ෂි දරයි. පිරිත යනු සත්‍ය ක්‍රියාවකි.

සත්‍යක්‍රියාවක් කිරීමට නම් සත්‍ය වූ යමක් සත්‍ය බවට විශ්වාස කිරීමට හැකි විය යුතුය. යමෙකුගේ චිත්ත සන්තානය තුළ කිසියම් සත්‍යයක් පිළිබඳ සැක පහළ වන්නේ නම්, විකල්ප අදහස් අනුමාන වශයෙන් හෝ මතුවන්නේ නම් ඔහුට සත්‍යය මත පදනම්ව ඇති පිරිත් සජ්ඣායනා තුළින් නිසි ඵල ලැබීම දුෂ්කරය. පිරිත තුළ ගැබ්ව ඇති බලය අපරිමිත ය.

විශාලා මහනුවර හටගත් වසංගත, දුර්භික්ෂ සහ අමනුෂ්‍ය බිය සහමුලින්ම තුරන් කිරීමට බුදුරජාණන් වහන්සේගේ රතන සූත්‍රයෙන් ලද පිහිට සවිස්තරාත්මකව ජීවමානව පූජාවලියෙහි සංග්‍රහ කොට ඇත. උතුම් ත්‍රිවිධ රත්නය තුළ ගැබ්ව ඇති සත්‍ය වූ අනන්ත මහා ගුණස්කන්ධය හුවා දක්වමින් බුදුරජාණන් වහන්සේ මෙම රුවන් සූත්‍ර දේශනාවෙන් වදාළ ධර්ම දේශනාවට අහසේ සිට සවන් දුන් ශක්‍ර දේවේන්ද්‍රයන් පවා අවසානයේදී, තුන් වරක් සාධුකාර දී ඇති බව සඳහන්ය.

කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර නායක හිමිපාණන් වහන්සේ විසින් පිරුවානා පොත් වහන්සේ හෙවත් චතුභානවාර පාලි ග්‍රන්ථයට සකස් කරදුන් සංඥාපනය තුළ සන්ධානය කර ඇති පරිදි පරිත්‍රාණය නොහොත් පිරිත සියලු ලෝක සත්වයාට මෙලොව පරලොව දෙකෙහිම සැප පිණිස වන්නේය. යක්ෂ භූත ප්‍රේත ආදීන් නිසාද දුර්භික්ෂ සහ සහ ස්වභාවික විපත් නිසාද ලෝක සත්වයාට නොයෙකුත් උවදුරු වලට මුහුණ පෑමට වන අවස්ථා බොහෝය. නුවණැති බෞද්ධ ලෝකයාට පරිත්‍රාණය හෙවත් පිරිත තරම් උභයාර්ථ සන්සිද්ධියට හේතු වූ වෙනත් සරණක් නැත්තේමය.

PREFACE

ප්‍රස්තාවනාව

The meaning of **Jinapañjara** is 'the armor of the Buddha'. **Jinapañjara** is the combination of two words, **Jina** means to 'the winner', which is **the Buddha,** and **pañjara** refers to 'mansion'. Thus, **Jinapañjara** means the mansion (which is strong as a piece of shield) that can protect from any dangers and enemies' It is bounded by the Victor's authority & strength, ramparts arrayed against them, may all misfortunes within & without, caused by such things as wind or bile, be destroyed without trace through the unending victor's majesty.

People get mental problems as well as physical troubles. Mind not only makes sick but also cures. There are more chances of getting well for an optimistic patient than the patient who is worried and unhappy.

By reciting this **Jinapañjara Gāthā** one can make the mind beautiful and awakened seeing the protection of this mansion. This safeguard can be seen only through the insight not through the naked eyes of humans. The one who recite this **Jinapañjara Gāthā** having strong faith gets the best use of it being secured thoroughly.

As I dwell, in all my affairs, always in the cage of the Self-awakened One, living on earth in the middle of the cage of the Victors, I am always guarded by all of those great noble men. Thus am I utterly well-sheltered, well-protected. Through the power of the **Victor: Buddha**, misfortunes are vanquished.

Through the power of the **Dhamma**, the enemy horde is subdued. Through the power of the **Saṅgha**, dangers are subdued.

Guarded by the power of the True Dhamma, I get on with in the Victor's Cage.

These **Paritta** generally translated as "protection" or "safeguard, refers to the Buddhist practice of reciting certain verses and scriptures in order to ward off misfortune or danger, as well as to the specific verses and discourses recited as paritta texts. The practice of reciting or listening to the paritta suttas is versatile. These short verses are recommended by the **Buddha** as providing protection from certain afflictions. **The belief in the effective power to heal or protect, of the saccakiriya, or asseveration of something quite true is an aspect of the work ascribed to the paritta.**

ජින පඤ්ජර ගාථා

THE STAZAS OF BUDDHA MANSION

1 ජයාසන ගතා වීරා - ජෙත්වා මාරං සවා හිණිං
චතුසච්චා මතරසං - යෙ පිවිංසු නරා සභා

Jayāsanagatā virā - Jetvā māram savāhinim
Catu saccāmatarasam - Ye pivimsu narāsabhā

ජය අසුනට පැමිණියාවූ මේ ශ්‍රේෂ්ඨ උත්තමයෝ
සේනා සහිත මරු පරදා, සිවුසස් නමැති අමා රස
පානය කළහ.

The Heroes, having defeated the Evil One
together with his army, mounted the seat of victory.
These leaders of men have drunk
the nectar of the FOUR TRUTHS.

2 තණ් හංකරාදයො බුද්ධා - අට්ඨ වීසති නායකා
සබ්බෙ පතිට්ඨිතා මය්හං - මත්ථකෙ තෙ මුනිස්සරා

Tanhankarādayo Buddhā - Attavīsati nāyakā
Sabbe patiṭṭhitāmayham - Matthake te munissarā

තන්හංකර ආදී වූ අටවිසි බුදු රජාණන් වහන්සේ
මාගේ හිස මත පිහිටත්වා !

May all the twenty- eight chief Buddhas, such as Buddha
Tanhankara and other noble sages , rest on my head !

3 සිරෙ පතිට්ඨිතා බුද්ධා - ධම්මො ච මම ලොචනෙ
සංඝො පතිට්ඨිතො මය්හං -උරෙ සබ්බගුණාකරො

Sire patiṭṭhitā Buddhā - Dhammo ca mama locane
Sangho patiṭṭhito mayham - Ure sabba gunākaro

මගේ හිසෙහි බුදුවරු ද , මගේඇස් හි ධර්මය ද
සංඝයා මගේ උරෙහි ද පිහිටත් වා !

May the Buddhas rest on my head;
the Dhamma on my eyes,
the Sangha, the abode of all virtues, on my shoulder!

4 හදයෙ අනුරුද්ධො ච - සාරිපුත්තො ච දක්ඛිණෙ
කොණ්ඩඤ්ඤො පිට්ඨිභාගස්මිං - මොග්ගල්ලානො සි වාමකෙ

Hadaye Anurudho ca - Sāriputto ca dakkhine
Konda*ñño* piṭṭhibhāgasmiṃ-Moggallāno' si vāmake

හදවතෙහි අනුරුද්ධ මහ රහතන් වහන්සේ ද
දකුණුපස සැරියුත් මහ රහතන් වහන්සේ ද,
පිටුපස කොණ්ඩඤ්ඤ රහතන් වහන්සේ ද,
වම් පස මුගලන් මහ රහතන් වහන්සේ ද, පිහිටත් වා!

May Anuruddha Maha Thera rest on my heart :
Sariptta Maha Thera on my right,
Konda*ñña* Maha Thera on my back ;
and Moggallana Maha Thera on the left !

5 දක්ඛිණෙ සවණෙ මය්හං - ආහුං ආනන්ද රාහුලා
කස්සපො ච මහානාමො - උභොසුං වාම සොතකෙ

Dakkhine savane maiham - Ahun Ananda Rāhulā
Kassapo ca Mahānāmo - Ubhosum vāma sotake

මාගේ දකුණු කණෙහි ආනන්ද හා රාහුල රහතන්වහන්සේලා ද වම් කණෙහි කස්සප, මහානාම රහතන්වහන්සේලා ද වැඩ සිටිත්වා!

May Arhanth Ananda and Rahula rest on my right ear,
Kassapa and Mahanama rest on my left ear.

6 කෙසන්තෙ පිට්ඨිභාගස්මිං
සුරියො විය පභං කරො
නිසින්නො සිරි සම්පන්නො
සෝභි තො මුනිපුංගවො

Kesante piṭṭhibhāgasmiṃ - suriyo viya pahaṅkaro
Nissinno sirisampanno - Sobhito munipuggavo

මාගේ කෙස් අන්තයෙහි හිරුමෙන් බබළන ශ්‍රීයෙන් යුක්ත වූ සෝභිත මහා රහතන්වහන්සේ වැඩ සිටී .

On my back at the end of my hair May the glorious lord **Sobhitha** who is radiant like the sun rest.

7 කුමාරකස්සපො නාම - මහෙසි චිත්‍රවාදකො
සො මය්හං වදනෙ නිච්චං - පතිට්ඨා'සි ගුණාකරො

මිහිරි වදන් වදාරණ , ගුණයට ආකාරයක් වූ කුමාරකස්සප තෙරණුවෝ මාගේ මුඛයෙහි වැඩ සිටිති.

Kumara Kassapo nāma - Mahesī cittravādako
So mayhaṅ vadane niccan - Patiṭṭhāsi gunākaro

The fluent speaker, the lord **Kumara Kassapa**, the abode of virtues ever rests in my mouth.

8 පුණ්ණො අංගුලිමාලො ච - උපාලි නන්ද සීවලී
ථෙරා පඤ්ච ඉමෙ ජාතා - ලලාටෙ තිලකා මම

පුණ්ණ, අංගුලිමාල , උපාලි, නන්ද, සීවලී යන තෙරුන් පස්නම මගේ නළලෙහි තිලකයන් ය.

Puṇṇo Angulimālo ca - Upāli Nanda Sivaiī
Therā pañca ime jātā - Lalāte tilakā mamạ

The five theras – **Punna, Angulimāla,Upāli, Nanda** and **Sivali** are on my forehead, like Tilakas,

9 සෙසාසීති මහා ථෙරා - විජිතා ජිනසාවකා
ජලන්තා සීලතෙජෙන - අංගමංගෙසු සණ්ඨිතා

බුද්ධශ්‍රාවක වූ අනෙක් අසූ මහා ශ්‍රාවක තෙරවරු සීල තේජසින් බබලන්නාහු, මගේ එක් එක් ඇඟ පසඟෙහි පිහිටියාහුය.

Sesāsitī mahā therā - Vijitā jinasāvakā
Jalantā sīlatejena - Aṅgammaṅgesu santhitā

The other eighty great Theras,(noble elders) the victorious disciples of the Conqueror , shining in the glory of their virtues, rest on the other parts of my body.

10 රතනං පුරතො ආසි - දක්ඛිණෙ මෙත්ත සුත්තකං
ධජග්ගං පච්ඡතො ආසි - වාමේ අංගුලිමාලකං

මගේ ඉදිරියෙහි රතන සූත්‍රය විය. දකුණෙහි මෙත්ත සූත්‍රය විය . පිටුපස ධජග්ග සූත්‍රය විය. වම්පස අංගුලිමාල පිරිත විය.

Ratanam purato āsi - Dakkhine metta suttakam
Dhajaggam pacchato āsi- Vāme Angulimālakam

The **Jewel discourse** is in my front, on my right is the discourse of **Loving kKindness**, the **Dhajagga** is on my back, on the left is **Angulimāla**

11 බන්ධ මොරපරිත්තඤ්ච - ආටානාටිය සුත්තකං
ආකා සච්ඡදනං ආසි - සෙසා පාකාර සඤ්ඤතා

බන්ධ පිරිත, මොර පිරිත, ආටානාටිය සූත්‍රය අහස් වියනක් මෙනි. අනෙක් පිරිත් පවුරක් වැනිය .

Kandha Mora parittañca - Atānātiya suttakam
Akasacchadanam āsi - Sesā pākāra saññitā

The protective discourses Khanda,Mora, and Atānātiya are like the heavenly vault. The others are like a rampart around me

12 ජිනානාබලසංයුත්තෙ - ධම්මපාකාර ' ලඞ්කතෙ
වසතො මෙ චතුකිච්චෙන - සදා සම්බුද්ධ පඤ්ජරෙ

බුදු අණ බලයෙන් යුක්තවූ දහම් පවුරෙන් සැරසුණු සිව් කිසෙන් යුතුව හැම කල්හිම බුදු මැදුරෙහි ම වසමි.

Jinānā balasanyutte - Dhamma pākāra laṅkate
Vasato me catu kiccena - Sadā Sambuddha pañjare

Ever engaged in four duties, do I dwell in the **Buddha mansion**, fortified by the commanding power of the **Buddha** and decked by the wall of the **Dhamma.**

13 වාත පිත්තාදි සඤ්ජාතා - බහිර්ජ්ඣත්තු පද්දවා
අසෙසා විලයං යන්තු - අනන්ත ගුණ තෙජසා

බාහිර උවදුරු හෝ ඇතුළාන්තයේ හටගත් වා පිත් ආදී උවදුරු අනන්ත ගුණ තේජසින් දුරුවේ වා!

Vāta pittādi saṃjātā - Bāhirajjattupaddavā
Asesā vilayan yantu - Ananta guṇa tejasā

May all internal and external troubles caused by air, bile such as anger: wrath: temper, come to zero without exception,by the power of infinite virtues.

14 ජිනපඤ්ජර මජ්ඣට්ඨං - විහරන්තං මහීතලෙ
සදා පාලෙන්තු මං සබ්බෙ - තෙ මහා පුරිසා සභා

පොලෝ තලයෙහි බුදු මැදුරෙහි වසන්නා වූ මා ඒ මහා උත්තමයෝ හැම කල්හිම රකිත්වා!

Jinapañjara majjaṭṭhaṃ - Viharantaṃ mahītale
Sadā pālentu maṃ sabbe - te mahāa purisasabhā

May all those great personages ever protect me who dwell in the centre of the **Buddha Mansion** on this earth.

15 ඉච්චෙව මච්චන්ත කතො සුරක්ඛො
ජිනා ' නුභාවෙන ජිතූපපද්දවො
බුද්ධානුභාවෙන හතාරි සංඝො
චාරාමි   සද්ධම්මනුභාව පාලිතො

මෙසේ අතිශයින් සුරක්ෂිත වූයේ ,
බුදු අනුහසින් උවදුරු දුරුකරන ලද්දේ
බුද්ධානුභාවයෙන් සතුරු සමූහයා
දුරුකරන ලද්දේ ධර්මයේ අනුහසින්
රකින ලද්දේ හැසිරෙමි.

Icceva maccanta kato surakkho
Jinānubhāvena jitūpapaddavo
Buddhaānubhāvena hatāri sangho
carāmi saddhamma'nubhāva pālito

Protecting myself thus in every way,
overcoming all troubles by the power of the conqueror ,
may I , by the grace of the **Buddha**,
defeat the hostile army passions
and live guarded by the sublime **Dhamma** !

16 ඉච්චෙව මච්චන්ත කතො සුරක්ඛො
ජිනා'නුභාවෙන ජිතූපපද්දවො
ධම්මානුභාවෙන හතාරි සංඝො
චාරාමි සද්ධම්මනුභාව පාලිතො

මෙසේ අතිශයින් සුරක්ෂිත වූයේ බුදු අනුහසින්
උවදුරු දුරුකරන ලද්දේ ධම්මානුභාවයෙන්
සතුරු සමූහයා දුරුකරන ලද්දේ ධර්මයේ
අනුහසින් රකිනා ලද්දේ හැසිරෙමි .

Icceva maccanta kato surakkho
Jinānubhāvena jitūpapaddavo
Dhammānubhāvena hatāri sangho
carāmi saddhamma'nubhāva pālito

Protecting myself thus in every way,
overcoming all troubles
by the power of the conqueror ,
may I, by the grace of the **Dhamma,**
defeat the hostile army passions and
live guarded by the sublime **Dhamma !**

17 ඉච්චෙව මච්චන්ත කතො සුරක්ඛො
ජිනා'නුභාවෙන ජිතූපපද්දවො
සංඝානුභාවෙන හතාරි සංඝො
චාරාමි සද්ධම්මනුභාව පාලිතො

මෙසේ අතිශයින් සුරක්ෂිත වූයේ බුදු අනුහසින් උවදුරු දුරුකරන ලද්දේ සංඝානුභාවයෙන් සතුරු සමූහයා දුරුකරන ලද්දේ ධර්මයේ අනුහසින් රකින ලද්දේ හැසිරෙමි .

Icceva maccanta kato surakkho
Jinānubhāvena jitūpapaddavo
Sanghānubhāvena hatāri sangho
carāmi saddhamma'nubhāva pālito
Protecting myself thus in every way, overcoming all troubles by the power of the conqueror ,may I, by the grace of the **Sangha,** defeat the hostile army passions and live guarded by the sublime **Dhamma** !

18 සද්ධම්ම පාකාර පරික්ඛි තොස්මි
අට්ඨාරියා අට්ඨ දිසා සු හොන්ති
එත්ථන්තරෙ අට්ඨ නාථා භවන්ති
උද්ධං වි තානංච ජිනා ඨිතා මේ

සදහම් පවුරකින් වටකරන ලද්දේ වෙමි. අෂ්ඨ ආර්යයෝ අට දිසාවෙහි වෙති. මේ අතර නාථයෝ අට දෙන අනුදිසාවන්හි වෙති. බුදුරජාණන් වහන්සේ මගේ හිස මත වියනක් මෙන් සිටියාහු වෙත්.

Saddhamma pākāra parikkhitosmi
Aṭṭhāriyā aṭṭha disāsu honti
Etthantare Aṭṭha Nāthā bhavanti
Uddhaṃvitānam'va Jināṭhitāme
I am surrounded by the rampart of the Sublime **Dhamma.** The Eight Ariyans are in the 8 directions. The Eight benefactors are in the intermediate directions. The **Buddha** stands like a canopy above me.

19 භින්දන්තො මාරසෙනං මම සිරසි ඨිතො
බොධි මාරුය්හ සත්ථා
මොග්ගල්ලානොසි වාමේ වසති භුජතටෙ
දක්ඛිණෙ සාරිපුත්තො
ධම්මොමජ්ඣෙ උරස්මිං විහරති භවතො
මොක්ඛතො මොර යොනිං
සම්පත්තො බොධිසත්තො චරණයුගගතො
භානු ලොකෙක නාථො

Bhindanto mārasenam mama sirasi ṭhito
Bodhimāruyha satthā
Moggallanosi vame vasati bhujatate
Dhakkine Sāriputto
Dhammo majjhe urasmiṃ viharati bhavato
mokkhato morayoniṃ
Sampatto Bodhisatto caranayugagato
Bhānulokeka Nātho.

බෝධි මූලයෙහි වැඩසිට, මාර සේනාව පැරදූ බුදුරජාණන් වහන්සේ මගේ සිරසේ වැඩ සිටිත්. මුගලන් තෙරහු වම් උරහිසෙහි ද, සැරියුත් තෙරහු දකුණු උරහිසෙහි ද, වැඩ සිටිති. ධර්මය හදවතෙහි වෙසෙයි. මයුර ජාතියෙහි ඉපිද හිරු මෙන් ලොවට සෙත කරන බෝසත් හු මාගේ දෙපා මත පිහිටි ආරක්ෂක බලය යි .

The **Buddha**,who sat at the foot of the Bodhi and defeated the army of the Evil One, stands on my head. The Venerable Moggallana is on my left shoulder and the venerable Sariputta is on my right shoulder.
The **Dhamma** dwells in my heart's core. The **Bodhisatta**, who was born a peacock, and who shines as sole Benefactor of the world ,shields my feet.

20 සබ්බා'වමංගල මුපද්දව දුන්නිමිත්තං
සබ්බීති රොග ගහදොස ' මසෙස නින්දා
සබ්බන්තරාය භය දුස්සුපිනං අකන්තං
බුද්ධානුභාව පවරෙන පයාතු නාසං

Sabbāvamaṅgala mupaddava dunnimittaṃ
Sabbī ti roga gahadosa ' masesa nindā
Sabbantarāya bhaya dussupinaṃ akantaṃ
Buddhānubhāva pavarena payātu nāsaṃ

සියලු විපත් , උවදුරු, දුර්නිමිති, බිය , රෝග,
ගහදොස්, නින්දා, අනතුරු, භයානක නරක සිහින
බුදු අනුහසින් දුරුවේවා !

All ill-luck, misfortunes, ill omens, diseases, evil planetary influences , blames, dangers, fears, bad undesirable dreams,
May they all dispel by the power of the **Noble Buddha !**

21 සබ්බා' වමංගල මුපද්දව දුන්නිමිත්තං
සබ්බීති රොග ගහ දොස ' මසෙස නින්දා
සබ්බන්තරාය භය දුස්සුපිනං අකන්තං
ධම්මානුභාව පවරෙන පයාතු නාසං

Sabbāvamaṅgala mupaddava dunnimittaṃ
Sabbī ti roga gahadosa ' masesa nindā
Sabbantarāya bhaya dussupinaṃ akantaṃ
Dhamānubhāva pavarena payātu nāsaṃ

සියලු විපත් , උවදුරු, දුර්නිමිති, බිය , රෝග,
ගහදොස්, නින්දා, අනතුරු, භයානක නරක සිහින
දම් අනුහසින් දුරුවේවා !

All ill-luck, misfortunes, ill omens, diseases, evil planetary influence, blame, dangers, fears, bad undesirable dreams,
May they all dispel by the power of the **Noble Dhamma**

22 සබ්බා ' වමංගල මුපද්දව දුන්නිමිත්තං
සබ්බීති රොග ගහ දොස ' මසෙස නින්දා
සබ්බන්තරාය භය දුස්සුපිනං අකන් තං
සංඝානුභාව පවරෙන පයාතු නාසං

Sabbāvamaṅgala mupaddava dunnimittaṃ
Sabbī ti roga gahadosa ' masesa nindā
Sabbantarāya bhaya dussupinaṃ akantaṃ
Sanghānubhāva pavarena payātu nāsaṃ

සියලු විපත් , උවදුරු, දුර්නිමිති, බිය , රෝග,
ගහදොස්, නින්දා, අනතුරු, භයානක නරක සිහින
සඟ අනුහසින් දුරුවේවා !

All ill-luck, misfortunes, ill omens, diseases, evil planetary
influence, blame, dangers, fears, bad undesirable dreams,
May they all dispel by the power of the **Noble Sangha**

Annotation

විවරණය

The Buddhas, noble men who drank the nectar of the four noble truths, having come to the victory seat, having defeated Māra together with his mount: these 28 leaders, sovereign sages beginning with **Taṇhaṅkara** are all established on the crown of **my head.**

Dhamma in **my two eyes**, the Saṅgha : the mine of all virtues is established **in my chest.**

Anuruddha is in **my heart,** and Sārīputta **on my right.** Koṇḍañña is **behind me,** and Moggallāna **on my left.**

Ānanda & Rāhula are in **my right ear**, Kassapa & Mahānāma are both **in my left ear.**

Sobhita, the noble sage, sits in consummate glory, shining like the sun all over the hair **at the back of my head.**

Elder Kumārakassapa — great sage, brilliant speaker, a mine of virtue is constantly **in my mouth.**

These five elders — Puṇṇa, Aṅgulimāla, Upālī, Nanda, & Sīvalī have arisen **as auspicious marks at the middle of my forehead.**

The rest of the 80 great elders :victorious, disciples of the Victor, sons of the Victor, shining with the majesty of moral virtue are established **in the various parts of my body.**

The Ratana Sutta is **in front,** the Metta Sutta **to the right.** The Dhajagga Sutta is **behind**, the Aṅgulimāla Paritta **to the left.**

The Khandha Paritta, Mora Parittas and the Āṭānāṭiya Sutta are a roof in space **over my head.** The remaining suttas are established **around me** as a rampart.

I am surrounded by **28 Buddha, 80 great victorious disciples,** and **Paritta** (Pali), such as **Jewel Discourse, Hymn of loving Kindness, Dhajagga, Angulimala,Khanda,Mora and Ātanatiya**

"Even if you practice only for an hour a day with faith and inspiration, good qualities will readily increase. Regular practice makes it easy to transform your mind. From seeing only relative truth, you will eventually reach a profound certainty in the meaning of absolute truth."

දෙවන කොටස

- අංගුලිමාල පිරිත
- ජලනන්දන පිරිත

“අංගුලිමාල පිරිත”

අංගුලිමාල තෙරණුවන් දිනක් ගරභනී මවක් දරු ප්‍රසූතිය සඳහා වේදනා විඳින හඬ අසා ඇයට පිහිට වීමට බුදුරජාණන් වහන්සේගෙන් උපදෙස් ඉල්ලා සිටි විට, ඇයගේ වේදනා පහව ගොස් ප්‍රසූතිය පහසු වීම සඳහා, සත්‍ය ක්‍රියාවක් කරන ලෙස බුදුරජාණන් වහන්සේ අනුදැන වදාළහ. “ **තමා ආර්ය ජාතියෙහි උපන් දා පටන් සත්ව ඝාතනයක් කර නැති බව සත්‍යයි. එ සත්‍යයේ බලයෙන් වේදනාවට පත් ගරභනී මවටත් , දරුගැබටත් සෙත් වේවා!** ” යනුවෙන් සත්‍ය ක්‍රියා කිරීමෙන් අනතුරුව ඇගේ වේදනා පහව ගොස් දරු ප්‍රසූතිය පහසු වූ බව ද ධර්මයේ සඳහන්ය. එම සත්‍යක්‍රියාව කෙතරම් බල සම්පන්න වූයේ ද යන්න අද පවා භාවිතා කෙරෙන **“අංගුලිමාල පිරිත”** තුලින් මනාව අත් දැකිය හැකිය. මෙම පිරිත බුදුරජාණන් වහන්සේ විසින් අංගුලිමාල නම් වූ මහ රහතන් වහන්සේට උගන්වා වදාරන ලදී.

“අංගුලිමාල පිරිත”

පරිත්තං යං භණන්තස්ස - නිසින්නට්ඨාන ධොවනං
උදකම්පි විනාසෙති - සබ්බමෙව පරිස්සයං
සොත්ථිනා ගබ්භවුට්ඨානං - යං ච සාධෙති තං ඛණෙ
ථෙරස්සංගුලිමාලස්ස - ලොක නාථෙන භාසිතං
කප්පට්ඨායි මහා තෙජං - පරිත්තං තං භණාමහෙ

(යතොහං භගිනි අරියාය ජාතියා ජාතො නාභි ජානමි
සංචිච්චපාණං ජීවිතා වොරොපෙතා,
තෙන සච්චෙන සොත්ථි තෙ හොතු සොත්ථි ගබ්භස්සාති ///)

සිංහල අරුත

සහෝදරිය, මම යම් විටක ආර්ය ජාතියේ උපන්නේවිද, පැවිදි උපසම්පදා ලැබීද, එතැන් සිට දැනුවත්ව ප්‍රාණියෙකුගේ දිවි තොර කළ බවක් නොදනිමි. **එ සත්‍ය වචනයේ බලයෙන්** ඔබට යහපතක්ම වේවා! දරු ගැබට සැපතක්ම වේවා! **මෙම උතුම් පිරිතෙන්,** **හෙවත් සත්‍ය වදනින් සියලු රෝග සැනෙකින් දුරු වී නිරන්තර සුවයක් ශාන්තියක් වේවා !**

බුදුරජාණන් වහන්සේ ජීවමානව සිටි අවධියේ පමණක් නොව, අනන්ත අප්‍රමාණ සංසාරගත සත්වයින් අද පවා මෙම අංගුලිමාල පිරිතෙන් නිසි ඵල ලබාගන්නා බව ද අත් දැකිය හැකි සත්‍යයකි.

කෙතරම් සත්‍යවාදීව දිවි ගෙවන අයෙකුට පවා වුවද, **ලෝභ,ද්වේෂ,මෝහ** අකුසල් මුල්වලින් වියරු වැදුන පෘතග්ජනයින්ගෙන් එල්ල වන අසත්‍ය චෝදනා, ඇනුම්,බැණුම් ගැරහුම් අනන්තය. එවා හමුවේ ඉන්ද්‍රකීලයක් සේ නොසෙල්වෙන මානසිකත්වයක් ගොඩ නගා ගන්නා ප්‍රඥාවන්තයින් තම බුද්ධියට නිගා නොදී ඔවුන් කෙරෙහි මෛත්‍රිය පතුරවයි. යහපත් අභිමතාර්ථ සාධනය පිණිස “ **සත්‍ය ක්‍රියා**” කරයි. අද්‍යෘශ්‍යමාන බලවේගයකින් මෙන් පැවති සියලු අහිතකර බලපෑම් සිඳී,බිඳී යන්නේ ද්වේෂ කරන්නවුන් මවිතයට පත් කරවමිනි.

ජලනන්දන පිරිත

චතු වීසති බුද්ධො ති - යො භවිස්සති උත්තමං
පාරමී බල යුත්තේ හි - ජලනන්දන මුත්තමං

අනොමානී ජලං තීරෙ - උත්තමං පත්ත චීවරං
පාරමීතේ ජලං හොති - සබ්බ බන්ධන ඡේද නං

ආනන්දෝති මහා ථේරං - උත්තමං ධම්ම භණ්ඩකං
යෙන භික්ඛු මහා ථේරං - සයනෙ බන්ධන විධ්වසනං

ඉති ශ්‍රී ලොක බුදධෙහි - යෙන ධම්මානු භාවතො
යන්ත්‍ර මන්ත්‍ර හරං කත්වා - විනාසං බුද්ධානු භාවතො

මුනින්දො හොති නමො බුද්ධං - මාරසේනා පමද්දති
දස කෝටි සහසසානි - සබ්බ බන්ධන ඡේද නං

පාරමීතා ගුණො හොන්ති - සො භවිස්සති උත්ත මං
අනෙක ජාති සංසාරං - සහස්සං ධම්මානු භාවතො

සයානොවා සහස්සානි - උත්තමං ගුණ පුග්ගලං
අසීතිං යෙන සබ්බෙපි - සබ්බ සිද්ධි භවන්තු තෙ

අසීතිං දස තේජේන - සර්ව භය විනාසිනං
සර්ව රෝග විනස්සන්තු - සර්ව බන්ධන ඡේද නං

යක්ෂ භූත පිශාචාත්ම - ග්‍රහ දොෂ විනාසනං
නමො ස්තු තෙ බුද්ධ රාජ - සර්ව දොස විනාසනං

මෙම ගාථා 9 න් සියලු බන්ධන කැපේ. ආරක්ෂාවට , නූල් බැඳීමට, තෙල් මැතිරීමට ඉතා යෝග්‍ය වේ. මෙයින් සියලු යන්ත්‍ර මන්ත්‍ර බල බිඳේ. විස කැවුනවිට, ඇවිල්ලට, මෙම ජලනන්දන පිරිත් ගාථා 9 න් කැඹිලි මතුරා දීමෙන් සුවය ලද හැක. පස්පව් වලින් වැළකී 108 වාරයක් පිරිත් කිරීමෙන් වඩාත් සාර්ථක ඵල ලැබිය හැක. සියලු බුදු රජාණන් වහන්සේලාගේ පාරමී බලය, අනන්ත වූ ගුණ තේජස යටපත් කළ හැකි කිසිදු බලවේගයක් විශ්වය තුළ නැත. ඒ සත්‍යයේ බලයෙන් සැමට සියලු ආරක්ෂාව සැලසේවා !!!

- ජින පඤ්ජරය යනු කුමක්ද ?

  What is the Buddha Mansion?

- ජින පඤ්ජරය කුමන ස්ථානයක පිහිටියේද?

  Where is the Buddha Mansion established ?

- කෙබඳු ආරක්ෂාවක් ජින පඤ්ජරය තුල පවතීද?

  How about the protection generate in it?

- ආරක්ෂිත පවුරු සකස් වී ඇත්තේ කුමකින්ද?

  What are the guarded ramparts built with?

- ජින පඤ්ජරය තුළ ජීවත්වන්නෝ කොතරම් සුරක්ෂිතද?

  How much protection are there for the dwellers in it?

ධර්මානුකූල පිළිතුරු පාලි, සිංහල සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් ගාථා 22 ක් තුළ අන්තර්ගතයි.

Answers according to Dhamma are included
in Pali, Sinhala, and English in 22 stanzas.

මෙම ග්‍රන්ථයෙහි පාලි ගාථාවන්හි ඉංග්‍රීසි සහ සිංහල පරිවර්තනයන්, මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනමේ අධ්‍යක්ෂිකා, කොළඹ 7, ඩී.එස්.සේනානායක විද්‍යාලයේ සේවයෙන් විශ්‍රාමලත් ප්‍රවීණ ඉංග්‍රීසි ආචාර්ණී කිරිවත්තුඩුවගේ සිතා නන්දනී ගුණතිලක මැතිනිය විසිනි.